මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
|---|---|
| දිනය | 2024 පෙබරවාරි 16 |

**ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹෙයි.**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ඒ ආශ්‍රිත අපරාධ පිළිබඳ විමර්ශන සහ නඩු පැවරීම් සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය 2024 ජනවාරි 09 වන දින ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයේ දී ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹිණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා ඉදිරියේ දී සුරාබදු කොමසාරිස් ජනරාල් ජේ. එම්. එස්. එන්. ජයසිංහ මහතා සහ මූල්‍ය බුද්ධි ඒකකයේ එවකට අධ්‍යක්ෂ ඊ. එච්. මොහොට්ටි  මහත්මිය අදාළ ආයතන වෙනුවෙන් අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම යනු ගෝලීය මෙන්ම ජාතික ආර්ථික හා මූල්‍ය පද්ධතිවල ස්ථාවරත්වයට තර්ජනයක් විය හැකි ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන මූල්‍ය අපරාධයන් වේ. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සහ මූල්‍ය බුද්ධි ඒකකය අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම මගින් එවැනි අනීතික කටයුතු වැළැක්වීම, අනාවරණය කර ගැනීම සහ එම වැරදි සම්බන්ධයෙන් විමර්ශනය කර නඩු පැවරීම සඳහා අත්‍යවශ්‍ය වන තොරතුරු හුවමාරු කර ගැනීමට හැකියාව ලැබේ.

මෙරට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමේ අරමුණින් මූල්‍ය බුද්ධි ඒකකය, 2008 වසරේ සිට මේ දක්වා විදේශීය පාර්ශ්ව 44 ක් සමග මෙන්ම ශ්‍රී ලංකා රේගුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය ඇතුළු තවත් දේශීය රාජ්‍ය ආයතන 11 ක් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹ ඇත.



සුරාබදු කොමසාරිස් ජනරාල් ජේ. එම්. එස්. එන්. ජයසිංහ මහතා සහ මූල්‍ය බුද්ධි ඒකකයේ එවකට අධ්‍යක්ෂ ඊ. එච්. මොහොට්ටි මහත්මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා ඉදිරියේ අවබෝධතා ගිවිසුම හුවමාරු කරන අවස්ථාව



වමේ සිට: මූල්‍ය බුද්ධි ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ඒ. ඩබ්ලිව්. යූ. සී. එන්. බණ්ඩාර මහතා; මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්ලිව්. ජී. එස්. එස්. ජේ. කීර්තිරත්න මිය; මූල්‍ය බුද්ධි ඒකකයේ එවකට අධ්‍යක්ෂ ඊ. එච්. මොහොට්ටි මහත්මිය; ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති කේ. එම්. ඒ. එන්. දවුලගල මහත්මිය; ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා; සුරාබදු කොමසාරිස් ජනරාල් ජේ. එම්. එස්. එන්. ජයසිංහ මහතා; සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම්) චන්ද්‍රසිරි සිල්වා මහතා; ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි ඩබ්ලිව්. එම්. එන්. පී. විජේසිරිවර්ධන මෙනවිය; සහ මූල්‍ය බුද්ධි ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ කේ. ඩී. එස්. එන්. අතුකෝරල මහතා මෙම අවස්ථාවට සහභාගී වූහ.